Department Sabaragamuwa Province/ Weekly School Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

සතිය : දෙවැනි සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : W.S.D. ලසන්ත ප්‍රනාන්දු මයා
කෑ/මාව/දැලිවල ම.වි -මාවනැල්ල

# ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගීත

## ❖ තුන්සරණේ ගී ගායනය

තුනුරුවන් සඳහා භක්තියෙන් ගැයූ ගීත තුන්සරණේ ගී ලෙස හැඳින්විය හැකිය. ගැමි ගී නිර්මාණයට හේතු සාධකයක් වූ ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණු ගී ගණයට මෙම ගී අයිතිවේ. වන්දනා ගමන් යාමේදී විශේෂයෙන් මෙම ගී ගායනා කර ඇත. වන්දනා ගමනේ ප්‍රධානියා වන නඩේගුරා විසින් ගීයේ පලමු පේලිය ගායනා කිරීමෙන් පසු සෙසු අය එය අනුකරණය කරයි.

වන්දනා ගමනේ ඇතිවන විඩාව, මහන්සිය නැතිකර බුද්ධාලම්භන ප්‍රීතිය ඇති කර ගැනීම සඳහා සැදැහැ සිතින් යුතුව ගායනා කරයි. මෙම ගී වලට ගැමි වහර යොදාගෙන ඇත. එමෙන්ම සරල පද මාලා සහ ඒකාකාරී නාදමාලා භාවිතාකර ඇත. බෞද්ධ කතා පුවත්, තෙරුවන් සම්බන්ධ කතා පුවත් මෙම ගී සඳහා තේමා කරගෙන ඇත.

01) බුද්ධං සරණේ සිරිස දරාගෙන
ධම්මං සරණේ සිත පහදාගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉඳුද්ඇදයි තුන් සරණේ අදහාගෙන

02) සීත ගඟුලෙදී ඇඳ පේවෙනවා
එතනදි සමහරු පඬුරු බඳිනවා
කෝඩු කාරයෝ ඉස්සර වෙනවා
සමන් දෙවිඳුනේ අප රැක දෙනවා

**පැවරුම්**

01- ඉහත සඳහන් කවි දෙක ලියා ඔබ දන්නා වෙනත් තුන්සරණේ ගී දෙකක් සොයා ලියන්න

02- තුන්සරණේ ගී යනු කුමක්දැයි හඳුන්වන්න

03- ගැමි ගී නිර්මාණකරණයේ දී තුන්සරණේ ගීත අයත් වන්නේ කුමණ ගීත ගණයටදැයි සොයා ලියන්න

04- තුන්සරණේ ගීත තුළ දක්නට ඇති ප්‍රධාන ලක්ෂණ 05 ලියන්න

05- තුන්සරණේ ගීත ගායනා කරන අවස්ථා මොනවාදැයි ලියන්න